# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## තනතුරු ඇබෑර්තු

පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. <u>නාවික නියමු (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම 3)</u>**

(අ) **යෝග්‍යතාවය**

නෞකාවක යාත්‍රාපතිවරයෙකු (සීමාරහිත) වශයෙන් සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සමඟ**

**පළපුරුද්ද :**

විදේශ වෙළඳ නෞකාවක යාත්‍රාපතිවරයෙකු ලෙස අවම වශයෙන් වසර එක (01) ක මුහුදු ගමන් පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 3 : 3 (SLM 3) |
| ආරම්භක වැටුප | : | රු. 76,875/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,555/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 150,000/= ක් පමණ වේ.

**2. <u>ප්‍රධාන මුහුදු යාත්‍රා සම්බන්ධීකරණ නිලධාරි තනතුර (මධ්‍යම කළමනාකරණ මට්ටම 2)</u>**

(අ) **යෝග්‍යතාවය**

දළ බර ටොන් 500 කට නොඅඩු වෙරළාන්ත මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල නාවික සුපරීක්ෂණ නිලධාරියෙක් ලෙස සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන සහතිකයක්

**සමඟ**

අධ්‍යක්ෂ (වෙළඳ නැව්) විසින් නිකුත් කරන ලද රේඩාර් නිරීක්ෂණ සහතිකය (Radar Observers Certificate) සමඟ ඉහළ තරංග ආයාම (VHF) සහ ගුවන්විදුලි සන්නිවේදනය (RT) පිළිබඳව පුළුල් දැනුමක් සහ චතුර ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව පැවතිය යුතුය.

**සමඟ**

**පළපුරුද්ද :**

අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම

(ආ) වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 4 : 2 (MLM 2) |
| ආරම්භක වැටුප | : | රු. 63,125/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,265/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 136,000/= ක් පමණ වේ.

**සටහන**

යහපත් කායික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා පෙනීමකින් හා ශ්‍රවණයකින් යුත් පුද්ගලයෙක් විය යුතුය. (වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.)

02 පිටුවට.......

**3. <u>අතිරේක ප්‍රධාන මුහුදු යාත්‍රා සම්බන්ධීකරණ නිලධාරි තනතුර (කණිෂ්ඨ කළමනාකරණ මට්ටම)</u>**

**(අ) යෝග්‍යතාවය**

දළ බර ටොන් 500 කට නොඅඩු වෙරළාන්ත මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල නාවික සුපරීක්ෂණ නිලධාරියෙක් ලෙස සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන සහතිකයක්

**සමඟ**

අධ්‍යක්ෂ (වෙළඳ නැව්) විසින් නිකුත් කරන ලද රේඩාර් නිරීක්ෂණ සහතිකය (Radar Observers Certificate) සමඟ ඉහළ තරංග ආයාම (VHF) සහ ගුවන්විදුලි සන්නිවේදනය (RT) පිළිබඳව පුළුල් දැනුමක් සහ චතුර ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව පැවතිය යුතුය.

**සමඟ**

**පළපුරුද්ද :**

අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම

**(ආ) වැටුප**

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 5 (JLM) |
| ආරම්භක වැටුප | : | රු. 60,000/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,150/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 133,000/= ක් පමණ වේ.

**සටහන**

යහපත් කායික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා පෙනීමකින් හා ශ්‍රවණයකින් යුත් පුද්ගලයෙක් විය යුතුය. (වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.)

<u>සටහන</u>

ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 45ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි.)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියලුම නීතිරීතිවලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළයුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි අධිකාරියේ ඕනෑම අංශයක / කොට්ඨාශයක හෝ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමඟ **ප්‍රධාන මානව සම්පත් කළමනාකරු, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13.** යන ලිපිනයට ලැබෙන සේ **2023-05-15** වන දින හෝ ඊට පෙර **<u>ලියාපදිංචි තැපෑලෙන්</u>** හෝ **විද්‍යුත් තැපෑලෙන්** (slpahrex@slpa.lk) එවිය යුතුයි. **අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

**<u>අදාල සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>**

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති**